**මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල - 2014**

-------------------------------------------------------------------------

මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ මෙහෙයුම් කටයුතු පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1981 අංක 66 දරන මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල් පනතේ 10(4) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 13(6) වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු 2014 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2017 ජූලි 24 දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු යැයි අදහස් කරන සමාලෝචිත වර්ෂයේ අරමුදලේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණ පමණක් මෙම වාර්තාවේ ඇතුළත් වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

---------------------------------------------------------------

භාර අරමුදලේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

------------------

**2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, 2013 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) ඇපයෙන් සීමිත සමාගමක් වශයෙන් සංස්ථාපිත ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනයේ (SLIIT) මුළු ප්‍රාග්ධනය වූ රු.373,500,000 ම භාර අරමුදල විසින් යොදවා තිබීම, එකී ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයින් රජයේ ආයතන ප්‍රධානීන් නියෝජනය කිරීම හා එහි මූල්‍ය හා මෙහෙයුම් ක්‍රියාකාරිත්වය සඳහා භාර අරමුදල මැදිහත් වීම යන කරුණු මත අරමුදලේ මූල්‍ය ප්‍රකාශන සමඟ එකී ආයතනයේ මූල්‍ය ප්‍රකාශනද ඒකාබද්ධ කළ යුතු වුවත් පළමු වරට 2012 ගිණුම් වර්ෂය සඳහා භාර අරමුදල විසින් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණි.

**2.2 වත්කම් හා වගකීම්වල පැවැත්ම**

--------------------------------------

භාර අරමුදල විසින් අවසන්වරට පිළියෙල කරන ලද 2012 දෙසැම්බර් 31 දිනට වූ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වත්කම්, බැරකම්, ආදායම් හා වියදම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| මූල්‍ය ප්‍රකාශන අයිතමය | වටිනාකම |
|---|---|
| | රු. |
| **වත්කම්** | |
| ජංගම නොවන වත්කම් | 10,394,883,490 |
| ජංගම වත්කම් | 4,348,718,920 |
| මුළු වත්කම් | 14,743,602,410 |
| **වගකීම්** | |
| ජංගම බැරකම් | 4,968,870,590 |
| ජංගම නොවන බැරකම් | 33,240,119 |
| මුළු බැරකම් | 5,002,110,709 |
| ශුද්ධ වත්කම්/අයිතිය | 9,741,491,701 |
| | 14,743,602,410 |
| මුළු ආදායම | 2,749,622,769 |
| මුළු වියදම | 1,925,706,140 |
| අතිරික්තය | 823,916,629 |

## 2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම්

පහත සඳහන් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති තහවුරු කිරීම් හා සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවිය.

| | විෂයය | වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|---|
| | | රු. | |
| (i) | ආයෝජන | 6,530,353,720 | ස්ථාවර තැන්පතු සහතික හෝ තහවුරු කිරීමේ වෙනත් ලියකියවිලි |
| (ii) | වරණීය කොටස් ආයෝජනය | 200,000,000 | කොටස් සහතික හෝ තහවුරු කිරීමේ වෙනත් ලියකියවිලි |
| (iii) | සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ආයෝජනය | 2,200,000 | කොටස් සහතික හෝ තහවුරු කිරීමේ වෙනත් ලියකියවිලි |
| (iv) | මහපොළ මංගත ලොතරැයිය | - | අභිලාෂය ප්‍රකාශ කිරීමේ ලිපි |

## 2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

2003 ජුනි 02 දිනැති අංක පීඊඞී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.4.1 වගන්තිය ප්‍රකාරව මාස 3 කට වරක් විගණන කමිටු පැවත්විය යුතු වුවත් සමාලෝචිත වර්ෂයේදී එම කමිටු පැවත්වීමට කටයුතු කර නොතිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

1981 අංක 66 දරන මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල් පනත අනුව භාර අරමුදලේ අරමුණු පහත දැක්වේ.

(i) යෞවනයන්ට උසස් අධ්‍යාපන පහසුකම් සැලසීම

(ii) සතුටුදායක ලෙස තම ද්විතීය අධ්‍යාපනය සම්පූර්ණ කර සිටින, ආධාර ලැබීමට සුදුසු යෞවනයන්ට තමන්ගේ ශාස්ත්‍රීය, කාර්මික හෝ තාක්ෂණික අධ්‍යාපනය අවස්ථාවෝචිත පරිදි, විශ්ව විද්‍යාලයක හෝ කාර්මික නැතහොත් උසස් අධ්‍යාපන ආයතනයක සම්පූර්ණ කිරීමට හැකි වන පරිදි ඔවුන්ට ආධාර සැලසීම

(iii) යෞවනයන්ට තමන්ගේ වෘත්තීය නිපුණතා සහ දක්ෂතා වැඩි දියුණු කර ගැනීමට හැකි වන පරිදි වෘත්තීය අභ්‍යාස ආයතන පිහිටුවීම සහ කළමනාකරණය කිරීම හෝ පිහිටුවීමට සහ කළමනාකරණය කිරීමට සහායවීම

(iv) අධ්‍යාපනය සැලසීමෙහි ලා නිරතව ඇති පාසල්, ආයතන, පදනම් සහ වෙනත් එවැනි ආයතන පිහිටුවීම සහ ඒවා කළමනාකරණය කිරීමෙහි ලා සහ පවත්වා ගෙන යාමෙහි ලා සහායවීම

(v) අධ්‍යාපනය සැලසීමෙහි ලා නිරතව සිටින කථිකාචාර්යවරුන්ගේ, ගුරුවරුන්ගේ සහ එවැනි වෙනත් තැනත්තන්ගේ නිපුණතා සහ දක්ෂතා නංවාලීම සහ වැඩිදියුණු කිරීම සඳහා ආධාර සැලසීම.

සමාලෝචිත වර්ෂයට අදාළව ශිෂ්‍යයින් විසින් ලබා නොගත් මහපොළ ශිෂ්‍යත්ව වාරික මුදල් එකතුව රු.21,205,800 ක් වූ අතර ඉන් රු.5,903,250 ක් මාස 5 කට වැඩිකාලයක් ද රු.19,200 ක් මාස 9 කට වැඩිකාලයක් ද රඳවාගෙන ආපසු අරමුදල වෙත එවා තිබුණි. නොගෙවූ ශිෂ්‍යත්ව වාරික මුදල් ප්‍රමාදයකින් තොරව ආපසු ගෙන්වා ගැනීමට සුදුසු පිළිවෙතක් අරමුදල විසින් අනුගමනය නොකිරීම නිසා එම මුදල් ඵලදායී ආයෝජනයක යෙදවීමෙන් ලබාගත හැකිව තිබූ ප්‍රතිලාභ ලබා ගැනීමේ අවස්ථාව අරමුදලට අහිමි වී තිබුණි .

## 3.2 කළමනාකරණ ක්‍රියකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය හා භාර අරමුදල අතර ඇති වූ ගිවිසුමෙහි 5(ඒ)(1) කොන්දේසිය අනුව, තොරතුරු තාක්ෂණ ආයතනයට කල්බදු පදනම යටතේ ලබා දී තිබුණු භූමිය සඳහා බදු කුළී වශයෙන් එම ආයතනයේ වාර්ෂික ශුද්ධ ලාභයෙන් සියයට 20 ක් හෝ රු.8,000,000 ක් යන වටිනාකම්වලින් වැඩි අගය අය කර ගත යුතු විය. ඒ අනුව 2006 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා අය කර ගත යුතු මුදල රු.207,784,617 ක් වුවත් අය කර ගෙන තිබුණේ රු.120,290,945 ක් වූයෙන් හිඟහිටි බදු කුළිය රු.87,493,672 ක් අය කර ගැනීමට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.

(ආ) 2013 ජූලි 11 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී මංගත ලොතරැයිය නැවත ක්‍රියාත්මක කිරීමට ගන්නා ලද තීරණය මත 2013 ජූලි 30 දින ගිවිසුම්වලට එළඹ තිබුණ අතර ලොතරැයිය ක්‍රියාත්මක කිරීම පෞද්ගලික සමාගමකට පවරා තිබුණි. අදාළ ගිවිසුමේ කොන්දේසි හා නියමයන්ට අනුව 2014 අගෝස්තු 01 සහ නොවැම්බර් 01 දිනෙන් ආරම්භවන කාර්තු වෙනුවෙන් රු.250,000,000 ක් ලැබිය යුතු වුවද 2017 මාර්තු 16 දින වන විටත් එම මුදල ලැබී නොතිබුණි. තවද ගිවිසුමේ 6.5 වගන්තිය අනුව නියමිත කාර්තුව ආරම්භයේ ආදායම නොලැබීම මත ප්‍රමාද ගාස්තු අය කළ යුතු වුවද 2014 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු ප්‍රමාද ගාස්තු රු.15,000,000 ක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) පාසල් සංවර්ධන අරමුදලෙහි ප්‍රතිපාදන යටතේ 2011 ජුනි 22 වන විට වැඩ අවසන් කර තිබූ පාසල් 5 ක විවිධ සංවර්ධන කටයුතු වෙනුවෙන් වෙන්කරන ලද රු.1,659,546 ක මුදලක් 2017 මාර්තු 15 දින වන විටත් ආදායමට ගෙන නොතිබුණි.

(ඈ) භාර අරමුදලේ කාර්යාලය පවත්වා ගෙන යනු ලබන සමුපකාර තොග වෙළඳ සංස්ථාවට (සතොස) අයත් ගොඩනැගිල්ලේ 6 වන මහල සඳහා පවිත්‍රතා ගාස්තු හා ගොඩනැගිලි කුළී වශයෙන් ගිවිසුමකින් තොරව පිළිවෙලින් රු.288,000 ක් හා රු.3,747,776 ක් ගෙවා තිබුණි.

## 3.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

භාර අරමුදල් පනතෙහි අරමුණක් නොවන උසස් පෙළ අධ්‍යාපනය ලබන සිසුන් සඳහා ශිෂ්‍යත්ව ලබා දීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂයේ පිළිවෙලින් රු.54,285,000 ක් හා රු.53,704,200 ක් වැය කර තිබුණ අතර ශිෂ්‍යත්ව සඳහා සිසුන් තෝරා ගන්නා පදනම, ශිෂ්‍යාධාර තීරණය කරනු ලබන ආකාරය හා වාර්ෂිකව ලබා දී තිබූ ශිෂ්‍යත්ව ප්‍රමාණය පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

## 4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

## 4.1 අභ්‍යන්තර විගණනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 133 හා 2009 ජුනි 09 දිනැති අංක ඩීඑම්ඒ/2009/(1) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය ප්‍රකාරව අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණු අතර අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන ඒකකය මගින් හෝ විගණන කටයුතු සිදු කිරීම කෙරෙහි අවධානය යොමුවී නොතිබුණි.

## 5. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු පිළිබඳව වරින් වර භාර අරමුදලේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | ආයෝජන කළමනාකරණය | නිසි අනුමැතිය ලබා නොගැනීම හා පසු විපරම් නොකිරීම. |
| (ආ) | මහපොළ ශිෂ්‍යත්ව අරමුදල් කළමනාකරණය | නොගෙවූ ශිෂ්‍යත්ව වාරික ආපසු අය කර නොගැනීම. |